ජැකාස්

අපායේ දෙයියෝ නැහැ,
ජැක්කෝ ඉන්නවා.

ත්‍රාසය, භීතිය සහ කුතුහලය සමග
මුතුමුදලිගේ නිශ්ශංකගේ
තවත් සිනමාමය නිර්මාණයක්...

ප්‍රථම මුද්‍රණය : 2025 සැප්තැම්බර්

ජැකාස්
ISBN : 978-624-5552-28-3

2025 © Muthumudalige Nissanka

මුද්‍රණය -
එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො 27/18 ජයන්ත වීරසේකර මාවත
කොළඹ 10.

සෝදුපත් පරීක්ෂාව - මිතුනි යසාරා
කවර නිර්මාණය - ප්‍රදීප් ප්‍රේමලාල්

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ.
එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.
සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2025

මෙම කෘතිය පීඩීඑෆ් ලෙස බෙදාහැරීම සපුරා තහනම් බැවින් මෙය පීඩීඑෆ් කර තිබුණහොත් ඊට විරුද්ධව නීතිමය පියවර ගැනීම සඳහා පහත අංකය ඔස්සේ කරුණාකර පොත්මී වෙත දන්වන්න.
0776882324 / publisher@pothmee.com

බස් එකේ ජැක් ගහපු
කොල්ලා දෙසට හැරී
"මම උඹේ
අම්මගේ වයසේ
නේද පුතේ"
යැයි ඇසූ ඒ අහඹු කාන්තාවටත්,

ජැක්කොන්ගේ පිළිකුලෙන් මිදීමට
ගෙදර විත් අඬා වැලපෙමින් ස්නානය කළ
ඒ ස්ත්‍රී වර්ගයාටත්
"ජැකාස්"
පුදමි!

මෙය ඔහුට තවත් සුපුරුදු දිනයක් ම විය. මේසය මත වූ 'සුදු කුඩු' තීරුව තවත් ටිකක් පටු කළ ඔහු, රෝල් කළ කොළයට නාසය තබා ඒ තීරුව එක හුස්මෙන් ම නාසයට ඇද ගත්තේ ය. එයත් සමග ම ඔහුගේ මුව විවර විය. දෑස් කුඩා වී මුළුමනින් ම වැසී ගියේ ය. ඔහු නාසයට ඇදගත් මත්කුඩු ක්‍රමයෙන් මුළු හිස ම වෙළාගෙන පැතිර යන බවත්, මොළයේ කුඩා සියුම් නහර පවා ඒවායේ ආස්වාදයට නළියන්නට පටන් ගන්නා බවත් ඔහුට දැනුණේ ය. ඒ හැඟීමත් සමග ඔහුගේ හිස ගැස්සුණේ ය. වරක් ගැස්සුණේ ය. දෙවරක් ගැස්සුණේ ය. ක්‍රමයෙන් එය භ්‍රමණය වෙන බැව් ඔහුට වැටෙහෙන්නට විය. ඔහු සෝපාවට ම හිස තබාගෙන, කමිහලේ වහලයට හරවා ගත් මුහුණින් යුක්තව මඳ වේලාවක් සිටියේ ය.

මේ මොහොත... ඔව්, මේ මොහොතට ඔහු ප්‍රිය කළේ ය. මනස භ්‍රමණය වෙමින්, හිසේ සෑම ස්නායු තන්තුවක් ම නළියන්නට පටන් ගන්නා මේ මොහොතට ඔහු බොහෝ සෙයින් ප්‍රිය කළේ ය.

"ම්... ම්... ම්... මේ ඇරඹෙන්නේ එයට හොඳම වේලාවයි..."

ඔහුගේ දෑස් එක් වරම විවර වූවේ ය. මුවින් සිනහ මාත්‍රාවක් පහළ වී එය එක් වර ම නැති වී ගියේ ය. ඔහු හිස සෝපාවෙන් මුදවා ගෙන, එක් වරක් හිස බෙල්ල වටා කැරකුවේ ය. ඉන්පසුව ඔහු ඉදිරියේ වූ දොර දෙස බැලුවේ ය. එය අගුළු දා වසා ඇත. බහිරවයෙකු සේ ඔහු එම බිම් මහල ආරක්ෂා කරමින් සිටියි.

ඔහු සිට ගත්තේ ය. සාක්කුවෙන් ගත් යතුරු කැරැල්ලක් ඇඟිල්ලේ දවට ගත් ඔහු ආයාසයෙන් ඇවිදිමින් එම දොර අසලට එන්නට වූවේ ය. එසේ එද්දී ඔහුගේ මුවින් විසිල් හඬක් නික්මිණි. ඔහු ගීතයක් ගයන්නාක් මෙන් කුමක් හෝ මුමුණන්නට වූවේ ය. ඇඟිල්ලේ රඳවාගෙන සිටි යතුරු කැරැල්ල ඔහු එම රිද්මයේ තාලයට ම කැරකුවේ ය. මත්කුඩු නිසා ක්‍රමයෙන් වැසී යමින්- යළිත් විවර වෙන ඔහුගේ දෑස්වලට ඔහු ඉදිරියේ ඇති දොර පමණක් නොව 'ඇයගේ' මුහුණත්

පෙනෙන්නට පටන් ගත්තේ ය. ඇය රුවැත්තියකි... ඊටත් වඩා ඇය ඇඳ සිටියේ සායකි...

“මී...මී... මී... සායක්...”

එය ඔහු වඩාත්ම ප්‍රිය කරන දෙයකි. ඒ රූපයත් සමග ම ඔහුගේ මුවින් ආස්වාදාත්මක හඬක් පිට විය.
“අහා...”

ඇයව යළිත් ස්පර්ශ කිරීමටත් පෙර ම ‘ඇය ඇඳ සිටි සායෙන් ම’ පමණක් ඔහු යළිත් ආස්වාදයට පත් වී ඇත.

දොර ආසන්නයට ආ ඔහු, දොර අසල සිටගෙන ඔහුගේ ම උරහිසට නාසය තබා ‘කාන්තාවන් ස්නානයෙන් පසුව තම උරහිස සිඹ බලන්නාක් මෙන්’ ඔහුගේ උරහිස සිම්ඹේ ය. එම සිඹීම යළි දැස් වසාගෙනත් වින්දේ ය.

“හ්ම්...”

ඔහුගේ මුවින් තවත් රාවයක් නැඟිණ. ඔහුට ඇත්තේ කෙට්ටු ශරීරයකි. නිරුවත් වූ උඩුකය නිසාවෙන් පැහැදිලිව පෙනෙන ඔහුගේ පපුව දෙස බැලුවහොත් එය කිසිදු රෝම කූපයක් නොමැතිවන සේ හොඳින් බූගා ඇති බැව් ඔබට දැකගන්නට ලැබෙනු ඇත.

- ඒත් මා මෙතැන් සිට කියන කිසිදු දෙයක් ඔබ මවා ගත යුතු නැත. මෙම අකුරු ඔබේ දෑසට ලක්වී ඔබේ මනස මේවා කියවූ නිමේෂයෙන් ම ඔබ මේ සියල්ල ම අමතක කළ යුතු ය. මන්ද යත් මෙයින් පසුව එළැඹෙන්නේ ජුගුප්සාජනක, මහත් අප්‍රසන්න වූ රූපරාමු කිහිපයකි.-

තම උරහිසින් එන පුසුඹ ආස්වාදය කළ ඔහු දොර විවර කළේ ය. ඒ විවර කරද්දී දොරෙන් ආ “ක්‍රෑක්” හඬත් සමග ම ඇයව ඔසවා තම උරහිසට ගනිද්දී ‘ඇයගේ මුවින් ආ එම සියුම් ශබ්දය’ ඔහුට යළිත් ඇසෙන්නට විය. ඔහුගේ උරහිසේ ගෑවී තිබුණේ ඇය බිලවුසයේ තවරා තිබුණු විලවුන් සුවඳයි.

දොර විවර කළ ඔහු සීරුවෙන් පාද තබමින් බිම් මහලට එන්නට විය. බිම් මහල අන්ධකාර ය. ඇතින් පෙනෙන කුඩා ආලෝකයක් හැරෙන්නට එය මුළුමනින් ම අන්ධකාරයේ ගිලී ගොසිනි. බිම් මහලේ අවසන් පඩිපෙළත් බැසගත් පසුව ඔහු එතැන බිත්තියේ වූ ස්විචය දැමී ය. එයින් මුළු බිම් මහල ම රතු පැහැ ආලෝකයකින් වර්ණවත් විය. ඔහුගේ දෑස් ඒ ආලෝකයෙන් තවත් මත්වූවාක් මෙන් ක්‍රමයෙන් වැසෙමින් විවර වෙන්නට පටන් ගත්තේ ය.
ඔහු සෙමෙන් පියවර තැබුවේ ය. බොහෝ ම සෙමෙන්, සොරෙකු නිවසකට ඇතුළුවන්නාක් සේ ඉතාමත් සෙමෙන් පා තැබී ය. ඔහු ඉදිරියේ ඇත්තේ රතු පැහැයෙන් පිරී ගිය ප්‍රමාණයෙන් මදක් විශාල ශාලාවකි. එම ශාලාවේ හරි මැදට වෙන්නට “බස් රථයක්” ඇත.

ඔව්... එය ඔහුට පෙනෙන්නේ ඒ ආකාරයෙනි. ඔහුගේ දෑස් කාමරයේ රක්ත ආලෝකයත් සමග මිශ්‍ර වෙද්දී ඔහු එය දකින්නේ ඒ ආකාරයට ය. එය බස් රථයකි. ඔහුට අනුව එය නිකන් ම නිකන් බස් රථයකුත් නොව ‘සෙනඟින් පිරී ගිය, දෙපැත්තට පැද්දෙමින් ධාවනය වෙන බස් රථයකි’.

ඒත් සැබැවින් ම එය එසේ නොවෙයි.

මෙම රක්ත වර්ණ ශාලාවට වීත් ඒ දෙස බැලුවහොත්, එය ඔබට ‘බස් රථයක ආකෘතියකට, ලී ගසා සවි කළ බස් රථයක අනුරුවක්’ ලෙස පෙනෙනු ඇත.

එය අනුරුවකි... නමුත් අඩුම තරමින් එය බස් රථයක් යැයි වටහා ගන්නට බස් රථවල ඇති සැබෑ රෝදත්, යකඩ බඳත්, ලී ආරුක්කුත් ඔබට උපකාරයක් වනු ඇත. ඔහු ඒ දෙස බලාගෙන මොහොතකට සිටගත්තේ ය.

“බස් එක එනවා...” සෙමෙන් මිමුණුවේ ය.

බසය නවත්තන්නට මෙන් අතක් ඉදිරියට දිගු කළ ඔහු තවත් තත්පර කිහිපයක් බලා සිට, ඒ දෙසට පෙරටත් වඩා වේගයකින් ඇවිදින්නට විය.

ඔහු බස් රථයට ඇතුළු වූවේ ය. බසය මිනිසුන්ගෙන් පිරී ඇත. මෙය ඔහුට බොහෝ ම වාසි සහගත තත්ත්වයකි. සෙනඟ නැති බස් රථවලට ඔහු කැමති නැත. බස් රථය පිරී ඉතිරී යන්නම සෙනඟ සිටිය යුතු ය. ඔහු සෙනඟ අතරින් මුලින් ම බස් රථයේ පා පුරුවට නැඟ ගත්තේ ය.

“මහත්තයා... නැග්ග නම් ඔහොම ඇතුළටම යන්න.”

බිමට බැස සිටින කොන්දොස්තර කෑ ගසන හඬ ඔහුට ඇසෙයි.

“දන්නවා අයිසේ, දන්නවා...”

ඒ දෙස බලා සෙමෙන් මිමිණූ ඔහු සෙනඟ අතරින්, එකිනෙකාව දෙපැත්තට තල්ලු කරමින් ඉදිරියට යන්නට විය.

-ඒ යන ගමන් ඔහුගේ දෑස බස් රථයේ සිටගෙන සිටින කාන්තාවන් දෙසට යොමු වන්නට විය.-

“මුහුණ, කොණ්ඩය, පස්ස
මුහුණ, කොණ්ඩය, පස්ස”

ඔහුගේ දෑස් සෙලවෙන්නේ එම රිද්මයට යැයි ඔහු දෙස බලා සිටින ඕනෑම කෙනෙකුට වැටහෙනු ඇත. ක්‍රමයෙන් ඉදිරියට ගිය ඔහු එක්වර ම නැවතුණේ ය. සිහිවිකලෙන් තිබුණු ඔහුගේ දෑස එක්වර ම වික්ෂිප්තව එක් රූපයක් ළඟ නැවතී ඇත.

ඒ ඇයයි... ඔව්, එක් අතකින් බසයේ අත්වාරුවත් අල්ලාගෙන, නිහඬ බැල්මකින්, කවුළුව හරහා පෙනෙන මාවත දෙස බලා සිටින්නේ ඇයයි.

“ආ... මගේ මැණික...”

ඔහුගේ දෑස්වල ඇත්තේ උද්‍යෝගයකි. අතක් කලිසමට යවා කලිසමත් බුරුල් කරගන්නා ගමන් ඔහු ඈ අසලට ළං වූවේ ය.

*****

ඔහු ඇගේ උරහිසට නැඹුරු විය. ජනේලය හරහා හමා එන සුළඟින් ඇගේ කෙහෙරැළි යාන්තමින් විසිරෙන්නට පටන්

ගෙන ඇත. ඔහු එම කෙහෙරැළිවලට නාසය තබා දිගු හුස්මක් ඉහළට ඇද ගත්තේ ය.

"ම්ම්ම්..." ඇයගේ පුසුඹ ඔහුට හුරුපුරුදු ය.

"මම කැමතිම උඹේ කොණ්ඩයෙන් එන සුවඳට මැණික, උඹේ පිටිපස්සට වෙලා හිටගත්ත ම, උඹේ තට්ටම්වල ඝනකම විතරක් නෙවෙයි ඔය සමෙන් එන සුවඳත් මට හොඳට පුරුදුයි..."
-ඇයගේ සුවඳත් විඳින ගමන් ඔහු හොරැහින් ඈ අසල සිටි මිනිසුන් කිහිපදෙනා දෙසත් බලන්නට විය. ඔවුහු බසයේ වීදුරුව දෙසට හැරී පිටත බලාගෙන ගමන් කරති. ඒ කිසිවෙකුටවත් තමා අසල සිටින කාන්තාවගේ ශරීරයේ ගැටෙමින්, ඇයගේ කොණ්ඩයේ පුසුඹ විඳීමට තැත් කරන මේ පුද්ගලයා ගැන කිසිදු නිනව්වක් නැත.-

"උඹලා කොහේ විරුද්ධ වෙන්නද, මේකී මගේ..."

ඔහු මිමුණුවේ ය. ඒ සමග ම ඇයට තවත් ළං වූ ඔහු ඇයගේ තට්ටම්වලට හොඳින් ගෑවෙන සේ හිටගත්තේ ය.

"හ්ම්..."

බසය පැද්දෙන්නට විය. ඒ පැද්දීමත් සමග ම ඔහුත් පැද්දුණේ ය. ඇයගේ තට්ටම්වලට ගෑවෙමින්, බසයේ පැද්දිල්ලත් සමග ම, ඇයගේ ශරීරයේ ද පහස විඳිමින් ඔහු පැද්දුණේ ය.

"හ්ම්..."

ඒ පැද්දීමත් සමග ම ඇයගේ උරහිසට හොඳින් නාසය තැබූ ඔහු, ඇයගේ සමෙන් එන එම විලවුන් සුවඳ සම්පූර්ණයෙන් ම ඇද ගැනීමට තැත් කරන්නෙකු මෙන් දිගු හුස්මක් ඉහළට ඇදගත්තේ ය. ඒත් සමග ම, ඇය පියවි සිහියට පැමිණියා ය.

ඔබ මෙම රක්ත වර්ණ කාමරයට වී, ඔහු නැඟ සිටින බස් රථ අනුරුව දෙස බලා සිටින කෙනෙක් නම්, ඔබට නිසැකව ම මා මේ කියන දේ ද දැකීමට හැකිවනු ඇත.

බස් රථ අනුරුව හරි මැදට වන්නට, කෙළින් හිටවා ඇති කාන්තා ශරීරයකි. ඇයගේ දෑත් ඉහළට ඔසවා බසයේ උඩු ආධාරකයට කර ගැට ගසා ඇත. ඇය සිහිසුන් ය. එසේ නැතහොත් ඇයට මත්ද්‍රව්‍ය පොවා සිහිසුන් කොට ඇති සෙයක් ඔබට පෙනෙනු ඇත. මේ සියල්ලට ම වඩා ඇය සිටින්නේ අඩ නිරුවතිනි. ඇයගේ උඩුකය සම්පූර්ණයෙන් ම නිරුවත් ය. ඒත් ඇය සායක් ඇඳ සිටියි. අඩි උස පාවහන් යුගලක් ද පැලඳ ඇත. ඇයගේ කරේ ඇති පබළු මාලයත් ඇයගේ පියයුරු මැදට වන්නට පිළිවෙළට සකසා ඇත. ඇයගේ ස්වරූපය අනුව ඈ 'කාර්යාලයක සේවය කරන තරුණ කෙල්ලෙකු' බැව් ඔබ එක්වර ම නිගමනය කරනු ඇත.

ඔව්, ඒ නිගමනය නිවැරදි විය යුතු ය. ඇය තරුණ කෙල්ලෙකි. ඇය කාර්යාලයක සේවිකාවක් විය හැක. ඒත් මේ මොහොතේ ඇය සිටින්නේ දරුණු මනෝ ව්‍යාධියෙකුගේ ග්‍රහණයේ ය. ඇයගේ දෑත් ඉහළට කොට ගැට ගසා ඇත්තාක් සේ ම ඇයගේ මුව ද ටේප් පටියකින් වසා ඇත. ඇයට මුව විවර කළ නොහැක. කෑ ගැසිය නොහැක. ඇයගේ ශරීරය අඩපණ වී ඇති නිසා ඇය පාදවලින් සිටගෙන සිටිනවාට වඩා - ඇයගේ දෑතින් ඇයව එල්ලා ඇත්තාක් සේ ඔබ දකිනු ඇත.

ඇයගේ පිටුපසින් සිටගත් තැනැත්තා, ඇයගේ තට්ටම්වලට හේත්තු වී ඔහුගේ ශරීරය ඇයගේ තට්ටම්වල අතුල්ලද්දි ඇයගේ මුවින් එන සියුම් රාවයක් ඔබට ඇසෙනු ඇත. ඇයට සිහිපැමිණි පසුව ඇය ඔහුව දැකීමෙන් කලබලයට පත් වන බව ද, දැහලීමට උත්සාහ කරන බව ද ඔබට පෙනෙනු ඇත. ඒත් ඒ කිසිවකින් ඔහුගේ ඇතිල්ලීම නැවතෙන්නේ නැත. ඒ ඇතිල්ලීමත් සමග ම ඔහු දැස් ක්‍රමයෙන් වසා ගනිමින් එක් අතක් ඇයගේ පියයුරුවලටත්, අනිත් අත ඇයගේ සාය තුළටත් ඔබා ගනිමින් ඇයව තවත් ස්පර්ශ කිරීමට වෑයම් කරනු ඔබ දකිනු නොඅනුමාන ය.

ඉතින්... අපි මෙතැනින් නැවතිය යුතු ය. මෙතැනින් පසුව විස්තර කිරීමට තරම් අප්‍රසන්න දර්ශන බොහෝමයකි. ඒ නිසා ම එම කොටස් මේ දරුණු මනෝ ව්‍යාධිකයාට බාර දී අපි මෙම කතාවේ මුල් ම පරිච්ඡේදය වෙත යා යුතු ය.

"ජැකාස්" මෙතැන් පටන් ආරම්භ වනු ඇත.

ජැකාස්

මුතුමුදලිගේ නිශ්ශංක

සරෝජා පත්තරකාරියකි, යක්ෂණියකි, නැට්ටුක්කාරියකි, ඒ සේරටමත් වඩා ඈ කෙල්ලකි. ඔබ මෙය කියවන දින සරෝජා නම් මේ යක්ෂ කෙල්ල බොරැල්ල බස් නැවතුමක ඉඳගෙන බස් රථයක් එන තුරු බලා සිටියා ය. ඒ බලා සිටින අතරතුර තම දුරකථනය අතට ගත් ඇය - තොල් උල්කර, ඇස් පුංචි කොට - සෙල්ෆියක් ගෙන එය තම 'යක්ෂණී' ෆේස්බුක් පිටුවේ අප්ලෝඩ් කළා ය. ඒ උඩින් කුඩාවට මෙලෙස ද ලියුවා ය.

"යක්ෂණී වැඩට යන ගමන්."

පින්තූරය දස දහසක් වූ ඇයගේ 'යක්ෂණී' ප්‍රේක්ෂක ජනයා වෙත මුදාහල ඇය, සතුටු සිනහවකුත් සමග දුරකථනය යළිත් බෑගයේ දමා ගත්තා ය. ඉන්පසුව බෑගය ඈ ඉඳසිටි බංකුවේ ම පැත්තකින් තැබූ ඈ කකුලක් පිට කකුලක් දමාගෙන සෝබාවන්ත අයුරින් බස් නැවතුමේ ඉඳගත්තා ය. බස් රථ එකිනෙක පැමිණෙයි. ඒවා බස් නැවතුම ඉදිරියේ නවත්වද්දී ජනෙල් අසල ඉඳගෙන අවට සිරි නරඹන මගී ජනයා මේ සෝබාවන්ත කෙල්ලව දකියි. සන්ග්ලාස් දෙකකුත් දමාගෙන, කකුලක් පිට කකුලක් දමා බස් නැවතුමේ 'එළිසබෙත් රැජින' සේ ලාලිත්‍යයෙන් ඉඳගෙන සිටින ඇයව දකින ඔවුන් කුමක් සිතයි ද? කුපාඩි කොල්ලෝ හොරෙන් ෆොටෝ ගනු ඇත, නකී අම්මණ්ඩිලා තරහෙන් පුපුරනු ඇත, කැත තරුණ කෙල්ලන් ඊරිසියාවෙන් පැලෙනු ඇත. මේ අයගෙන් කවරෙකු හෝ යක්ෂණී පිටුවේ සාමාජිකයෙකු නම් ඔවුන් ඇයගේ ෆොටෝවක් ගෙන 'අද පාරෙදි යක්ෂණීව දැක්කා.' යනුවෙන් එම ෆොටෝවත් සමාජ මාධ්‍යට මුදාහරිනු ඇත.

ඇය කකුලක් පිට කකුලක් දමාගෙන, හැමෝටම පෙනෙන්නට සෝබන ලෙස ඉඳසිටි මොහොතේ එක්වර ම ඇයගේ බඩ කැළැතෙන්නට පටන් ගත්තේ ය. බඩෙන් ආ කුඩා රිදීමකුත් සමග, ඇගේ යටිබඩ ක්‍රමයෙන් තෙත්වෙනු ඇයට දැනිණි.

සරෝජාගේ දෑස් උඩ යන්නට විය. අහසේ ඉර හොඳින් ම පායා ඇති මේ මොහොතේ පවා ඇයට තම පාට කණ්ණාඩි අස්සෙන් තරු පෙනෙන්නට විය. ඇය බංකුවේ තැබූ බෑගය ඉක්මනින් ම අතට ගෙන එය තම බඩ මත තබා ගත්තා ය.

“යක්ෂණී ඉවරයි...” ඇය මිමුණුවා ය.

“ඒකත් මේ වෙලාවෙම... අද පෑඩ් පැකට් එකත් ගේන්න බැරිවුණා. ගෙනාවත් ඒක අදින්න ආයෙත් ගෙදරට යන්න වෙනවා. බෑ ගෙදර යන්න බෑ, ගෙදරට මෙතන ඉඳන් විනාඩි තිහක් ඇවිදින්න ඕනේ, එහෙම වුණොත් මීටින් එකට පරක්කු වෙනවා.”

ඇය බෑගය විවෘත කළා ය. අමතක වීමකින් හෝ එක් පෑඩ් එකක්වත් බෑගයේ ඇත්දැයි බැලුවා ය.

“චිහ්, ඒකත් මගෙම වෙලාව...”

බෑගයේ පෑඩයක් තියා නැප්කිමක්වත් නැත. ඇයට හීන් දහඩිය දමන්නට විය. බෑගයෙන් ගත් ලේන්සුවෙන් දහඩියෙන් පිරී යන නළලත්, කදුළු උනන්නට ඔන්න මෙන්න ඇති ඇස් දෙකත් පිහදාගත් ඇ, ඔරලෝසු අත හරවා වෙලාව බලන්නට විය. යක්ෂණියකට වුවත් මෙවන් වේලාවන්වල දී ඇස්වලට කදුළු උනන්නේ අහම්බෙනි.

වෙලාව උදෑසන දහයට ආසන්නව ඇත. ඊළඟට පැමිණෙන බස් රථයෙම පිටත් වී යා යුතු ය. ඒත් ඊට කලින් මෙයට කුමක් හෝ කළ යුතු ය. මෙය දෝරෙ ගැලුවහොත් ‘යක්ෂණී කපෝති’ වෙනු ඇත. ඇයගේ දෑස් එක්වර ම අතේ තිබුණු ලේන්සුවට යන්නට විය.

“නෑ, මේක හරියන්නෑ...”

ඉන්පසුව ඇය පාරේ එහාපසින් ඇති කඩයක් දෙස බැලුවා ය.

“කඩේට ගිහින් පෑඩ් පැකට් එකක් ගන්න ඕනේ.”

“ඒත් ඊට කලින් මේ බංකුවෙන් හිටගන්න ඕනේ.”

ඇය බෑගයත් බඩට ම තුරුළු කරගෙන බංකුවෙන් සිටගත්තා ය.

“තවම ලාවට... තව ටිකකින් වැඩි වෙන්න පුළුවන්. මුල් ම දවසනේ, හරියට ම තීරණේකට එන්න බෑ. කෝකටත් පෑඩ් පැකට් එකක් අරගෙන එන එක හොඳයි.”

බෑගය විවෘත කොට එහි තිබුණු මුදල් පසුම්බිය අතට ගත් ඇය එයත් අතේ ගුළි කරගෙන හොරෙන් මෙන් ඇයගේ දෑස් ඈ ඉඳසිටි බංකුවට හරවන්නට විය.

“නිකමටවත් ගෑවිලා තිබුණොත්...”

නැත, බංකුවේ කිසිවක් නැත.

“ඒ කියන්නේ ඇඳගෙන ඉන්න ඩෙනිම් කලිසමෙත්?” ඇය ඒ බැල්මෙන් ම ඇගේ පස්ස පැත්ත බලන්නට විය.

-ඒ හොර බැල්මෙන් ම, කිසිවෙකුටත් සැකයක් නොසිතෙන ලෙස- ඇය තම පස්ස පැත්ත බැලූ මේ මොහොතෙ ම, සරෝජා තවත් යමක් දුටුවා ය. එය දකින් ම ඇයගේ දෑස් එතැනට ම ඉලක්ක වී නතර විය.

ඇය සිටි බංකුවේ ම ඈ අසල ඉඳගෙන සිටින කාන්තාවකි. එම කාන්තාවට එහා පසින් මඳක් කෙළවරට වන්නට වයසක පිරිමියෙකි. සරමක් ඇඳගෙන කකුලක් පිට කකුලක් දමාගෙන සිටින මේ වයසක මිනිසාගේ මුහුණේ ඇත්තේ අමුත්තකි.

මෙවැනි වෙනස්කම් සරෝජාගේ යක්ෂ ඇස්වලට හොඳින් පෙනෙන නිසාවෙන් ඈ ඔහු දෙස වඩාත් උවමනාවෙන් බැලුවා ය. ඔහු එක් අතක් බංකුවට තබා ඇති අතර අනිත් අත කකුල් දෙක අස්සට ඔබාගෙන ඇත. ඒ කකුල් දෙක අස්සට දමා ගත් අත සෙලවෙයි, සෙමෙන් සෙමෙන් උඩට පහළට යයි. ඒවා උඩට පහළට ගෙනියන අතර ඒ නාකියා (එය දකින් ම සරෝජාගේ ඔළුවට ආවේ ඒ වචනයයි) ඔව් ඒ නාකියා බස් නැවතුමේ සිටගෙන සිටින කෙල්ලෙකු දෙස බලාගෙන සිටියි.

සරෝජා ද ඔහුගේ දෑස් දිගේ ගොස් ඒ කෙල්ල දෙස බැලුවා ය. ඇය තරුණ කෙල්ලෙකි. නිසැකවම කාර්යාලයක වැඩ කරන කෙල්ලක විය යුතු ය. ඇය නිල් පැහැ සාරියකින් සැරසී අඩි උස පාවහන් යුගලක් පැලඳ සිටියි. ඇය පැලඳ සිටින අඩි උස පාවහන් දෙක නිසාම කෙල්ලගේ පස්ස පැත්ත සාරියෙන් උඩට ඉස්මතු වී ලාලිත්‍යව පෙනෙයි. නාකියා දෑසත් ලොකු කරගෙන බලාගෙන සිටින්නේ කෙල්ලගේ පස්ස පැත්ත දෙසයි.

එය දකිත් ම සරෝජාගේ රුධිරය ක්‍රමයෙන් උණුසුම් වන්නට විය. උදෑසන හිරු එළියටත්, ඇයගේ ශරීරයෙන් මේ මොහොතේ ගලාගෙන යන රුධිරයටත් වඩා ඇයගේ හදවතේ රුධිර ස්පන්දනය ඇයට දැනෙන්නට පටන් විය. ඇයගේ මනසේ ස්නායු තන්තු එම උණුසුම් රුධිරයත් සමග ම කෝපාවිෂ්ට වන්නට විය.

සරෝජාට යක්ෂාවේෂ වන මොහොත එළඹී ඇත. නාකියාගේ මේ තිරිසන් වැඩේ නිසා ඇය කෝපයෙන් වෙවුලන්නට වූවා ය. සරෝජාට ඇය සිටි අවිනිශ්චිත තත්ත්වය අමතක විය. ඒ වෙනුවට කෝපයෙන් වෙව්ලා ගිය දෑසත් සමග ඇය නාකියා දෙසට අඩියක් තැබුවා ය. බෑගයෙන් ජංගම දුරකථනය ද අතට ගෙන එහි වීඩියෝ රෙකෝඩරයේ බටනය ද එබුවා ය. ඇය සූදානම් විය. නාකියාගේ සම්පූර්ණ ක්‍රියාව ම වීඩියෝ තිරයට ගත් ඇය ටික මොහොතක් නාකියාට ඌ කරන දේ කරන්නට ඉඩ දී බලා සිටියා ය.

නාකියාට නිනව්වක් නැත. ඌ කෙල්ලගේ පස්ස දෙස බලාගෙන අත උඩටටත් පහතටත් ගෙන යයි. ටික මොහොතකින් ඌගේ කට විවර වන්නටත්, දෑස් තවත් ලොකු වන්නටත් වූ අතර, අතේ වේගය ද වැඩිවන්නට විය. සරෝජා වීඩියෝව යාන්තමට උඩට එසවී ඇති උගේ ලිහුවටත්, එය සොලවන අතටත් සූම් කර ඇල්ලුවා ය. කුලප්පුවේ උපරිම තැනට ළඟා වූ විට නාකියාගේ අතේ වේගයත් ඒ අනුව ම තවත් වැඩි වන්නට විය. ඌ බස් නැවතුමේ කිසිවෙකුවත් මායිම් කළේ නැත. උගේ දෑස්වල බියක් හෝ නපුරක් ගැන අදහසක් හෝ නොනිබුණේ ය. ඒ නිසාම සරෝජා තවත් අඩියක් ඌ දෙසට ළං වී දුරකථනය උගේ ලිහුවටම දික් කළා ය.

නාකියා එය දැක්කේ ය. කුලප්පුවේ උපරිම මොහොතේ දී තමන් දෙසට හැරී ඇති දුරකථනයත්, තමන් දෙස බලාගෙන සිටින කෙල්ලත් නිසාවෙන් ඔහුට දෙලොව රත් වෙන්නට ඇත. ඔහු ලිහුවට තබා ගත් අතත් සමග ම සරෝජා දෙස බලා බයාදු බැල්මකින් විරිත්තන්නට වී ය. ඒ විරිත්තීමට සරෝජාගේ හිතට ආ කෝපය තවත් අසූ භාරදාට නගින්නට විය. ඇය මෙතෙක් හිරකරගෙන සිටි කෝපය නාකියා වෙත මුදාහැරියා ය.

“මෙන්න මූ අතේ ගහනවා...”

ඇයට ඊට වඩා එය කිව හැකි සම්භාව්‍ය වචනයක් සොයා ගැනීමට නොහැකි විය.
“මම සේර ම වීඩියෝ එකට ගත්තා. මේ... සේර ම රෙකෝඩ් වෙනවා.”

ඇය ජංගම දුරකථනය නාකියා දෙසට දික් කරමින් බස් නැවතුමේ සිටි සියල්ලන්ට ම ඇසෙන සේ බෙරිහන් දුන්නා ය.

“වල් බල්ලා... උඹ ඔය අතේ ගහන්නේ බස් හෝල්ට් එකේ නේද?”

ඇය අසන්නට වූවා ය.

“ගැහැනියෙක්ටවත් බස් හෝල්ට් එකේ ඉන්න නෑ. වල් බල්ලා...”

ඇයව තවත් වෙවුලන්නට විය. ඇය දුරකථනය තවත් ටිකක් නාකියා දෙසට දික් කළා ය.

“බල්ලා... තොට ලැජ්ජාවක් නැද්ද, බස් හෝල්ට් එකේ මිනිස්සු පිරිලා ඉන්න වෙලාවක ඕකට අත ඔබාගෙන හොල්ල හොල්ල ඉන්න?”

ඇය දුරකථනයත් දික් කරගෙන ඔහු ආසන්නයට ම කඩා පැන්නා ය. නාකියා බියට පත් විය. සරමත් හරිගස්සාගෙන හිටගත් ඔහු බස් නැවතුමෙන් පිටවෙන්නට වෑයම් කළේ ය.

“යන්න එපා, සේර ම රෙකෝඩ් වෙලා තියෙන්නේ. ඔහොම ඉඳපන්... උඹව මම මේ වීඩියෝ එකත් එක්ක ම පොලිසියට බාර දෙනවා. ඔතනම ඉඳපන්...”

සරෝජා ‘කොටියෙකු තම ගොදුර ඉදිරියට කඩා පනිනවාක්’ මෙන් දුවන්නට සූදානම් වුණු නාකියා ඉදිරියට කඩා පැණ්නා ය. නාකියා එයින් තවත් බියට පත් විය. සරමත් එක් අතකින් උස්සාගෙන, සරෝජා එල්ල කරගෙන සිටින දුරකථනය දෙසත් බලමින්, අතකුත් සරෝජා දෙසට දික් කරමින් ඔහු ද සරෝජාට බැන වදින්නට වී ය.

“මේ මොන මළ හෝන්තුවක් ද, මම කරපු දෙයක් නෑ. නෝනට වැරදිලා...”

ඔහුට කීමට ලැබුණේ එපමණකි. ඒ මොහොතෙ ම ඔහුගේ ඔළුවට එල්ල වූ කුඩ පහරකින් ඔහුව වෙව්ලා ගියේ ය. ඔළුවත් අල්ලාගත් ඔහු සරමත් එක අතකින් උස්සගෙන බස් නැවතුමෙන් දුවන්නට පටන් ගත්තේ ය. ඔහුට කුඩ පහර එල්ල කළ කාන්තාව බිම වැටුණු කුඩය අහුලාගෙන එයින් තවත් වරක් ඔහුට දමා ගැසුවා ය.

-ඒ සරෝජා අසල ඉඳගෙන සිටි කාන්තාවයි.-

“මමත් දැක්කා උෆ ලබ්බ එළියට දාගෙන හොල්ලනවා. කෝ මෙතන පිරිමි නැද්ද අර දුවන එකාව අල්ලන්න...”

ඇයගේ දෑස් බස් නැවතුමේ සිටගෙන, තුෂ්ණිම්භූතව මෙම සිදුවීම දෙස බලාගෙන සිටින පිරිමින් දෙසට එල්ල විය.

“අන්න අරූ දුවනවා, මට මේ සාරියත් එක්ක දුවන්න බෑ, නැත්නම් මම ඕකව අල්ලගෙන එනවා, කෝ ඕගොල්ලෝ පිරිමි නේද?”

ඒත් බස් නැවතුමේ සිටි කිසිම පිරිමියෙකු ඉදිරියට ආවේ නැත. සමහරු ආපසු හැරී මාර්ගය දෙස බලන්නට වූහ. තවත් අය නෑසුණාක් සේ කරබා ගත්තෝ ය. තවත් උන් දුවන වයසක මිනිසා දෙස පුදුමයෙන් මෙන් බලා සිටින්නට විය.

මේ සේර ම අතර සරෝජා බස් නැවතුමේ සිටි පිරිමින්ව ද වීඩියෝවට හසු කරගත්තා ය.

"ඌ විතරක් නෙමෙයි මුන් සේර ම එකයි. පිරිමි කිව්වට යට එක විතරයි පිරිමි, වෙන පිරිමි කමක් නෑ."

ඇය කීවෙන් එතැන සිටි එක් පිරිමියෙක් ඈ දෙසට හැරුණේ ය.

"අපි මොනව කරන්නද නෝනා? ඌ දැන් දුවලා ඉවරයිනේ, ඌගෙ පස්සේ දුවන් ගියොත් අපි වැඩට යන්නේ කොහොම ද? අනික නෝනලා දැක්කා කියන එක අපි දැක්කේ නැනේ. දැක්කත් ඕක ලොකු දෙයක් ද? ඔය යකා අද විතරක් නෙමෙයි හැමදාම උදේට ඔන්න ඔය බංකුවට වෙලා ඉඳගෙන ඉන්නවා, කවුද ඔහොම එකක් දන්නේ..."

සරෝජා වීඩියෝව නැවැත්තුවේ නැත. පිරිමියාගේ වචනවලින් ආ ආවේගය නිසාම ඇයගේ අත වෙවුලන්නට වූවෙන් ඇය දුරකථනය අනිත් අතට ගත්තා ය. නාකියා කළ දේට වඩා පිරිමියාගේ වචනවලින් ඇයගේ කෝපය තවත් වැඩි වන්නට ඇත.

"ඔහොම ඉඳගෙන ඉන්නවා කියන්නේ, ඔහොම නෙමේ ඌ ඉඳගෙන හිටියේ යට එකත් එළියට දාගෙන..."

"ඉතින් අපි දැක්කේ නැනේ..."

"ඕගොල්ලෝ දකින්න ඕන නෑ, දැක්ක එක තමයි මම කිව්වේ."

ඇය දුරකථනය පිරිමියා දෙසට එල්ල කළා ය.

"මේ ඕක මට දික් කරන්න එපා. අහකට ගන්න හරි ද... මම නෙමේනේ කළේ, කරපු එකාව අල්ලගන්න."

ඔහු එසේ පවසා දුරකථනයට පිටුපා පාර දෙසට ඇවිද්දෙන්, ඒ ආවේගයෙන් ම සරෝජා එතැන සිටි කාන්තාව දෙස බැලුවා ය.

“බලන්නකෝ ආන්ටි මුන්ගේ කතාව... උන් දැක්කේ නැලූ, මෙච්චර කියද්දි ‘අපි දැක්කා’ කියලා මුන් එකෙක්ටවත් ඒකේ ගානක්වත් නෑ.”

“වැඩක් නෑ දුව...”

කාන්තාව බිම වැටුණු කුඩය අහුලාගෙන එය නවා අතේ ගුළි කරගත්තා ය.

“ගැහැනු අපි ඕවා දැකලා මෙහෙම හරි කතා කළේ නැත්නම් පිරිමින්ට ඒවයේ ඇති ගානක් නෑ. තමන්ගේ පවුලේ ගෑනියෙක්ටත් මේ දේම වෙනකන් උන්ට කටක් හොල්ලන්නවත් හිතෙන්නෑ.”

ඇය බංකුවට ගොස් ඉඳගත්තා ය. සරෝජා තවමත් සිටගෙන ය, ඇයගේ විඩියෝව තවමත් ක්‍රියාත්මක වෙයි. ඇය බස් නැවතුම ඉදිරියේ සිටින අය දෙසට දුරකථනය අල්ලාගෙන සිටියි. ඒ අතර බංකුවේ ඉඳගත් කාන්තාව යමක් දුටුවෙන් ඇය යළිත් විත් සරෝජාගේ උරහිසට අතක් තබා රහසින් මෙන් මෙසේ කීවා ය.

“දැන් ඕක ඕෆ් කරන්න.”

සරෝජා ඈ දෙස බලන්නට විය.

“ඕෆ් කරන්නකෝ...”

කී කාන්තාව යාන්තමින් ඇයගේ ඇස් සරෝජාගේ ඩෙනිම දෙසට හැරවූවෙන් සරෝජාට ද ඇය පවසන්නේ කුමක්දැයි වැටහෙන්නට ඇත. ඇය වීඩියෝව නැවැත්වූවා ය. එක් අතක් පිටුපසට යවා කලිසම අල්ලා බැලුවා ය. හිතට ආ කෝපය නිසාම ඇයටත් නොදැනීම එයත් පිටවෙන්නට ඇත. ඇය එයින් ලැජ්ජාවට පත් වූවා ය. සරෝජාගේ මුහුණ වෙනස්වනු දුටු කාන්තාව ඇයගේ උරහිස සෙමෙන් පිරිමැද්දා ය.

“කමක් නෑ. කවුරුත් දකින්නෑ, ඔහොම ඉන්න...”

කී ඇය තම බෑගය බංකුව මත තබා එයින් සේද සළුවක් එළියට ගත්තා ය.

“මේක මම පාක් එකට ගියාම ඉඳගන්න දාන එකක්. මේක ඔහොම ඉනවටේ ඔතාගන්න ස්ටයිල් එකට වගේ.”

ඇය එය සරෝජා අත තැබුවෙන් සරෝජා සළුව ගෙන ඩෙනිම් වැහෙන්නට, විලාසිතාවක් මෙන් ඉන වටා බැඳගත්තා ය.

“හ්ම්, දැන් හරි... කාටවත් පේන්නෑ.”

කී කාන්තාව බොහෝ ම සතුටින් සරෝජා දෙස බැලුවා ය. ඇයගේ මුහුණට මතුවූයේ සිනහවකි. සරෝජාද ඈ දෙස බලා යාන්තමින් සිනහසුණා ය.

“බොහෝ ම ස්තූතියි ආන්ටි.” ඇය කීවා ය.

“මොනටව ස්තූති කරන්නද, මටත් දුවෙක් ඉන්නවා.”

“ආ එහෙම ද?”

සරෝජා පුදුම වූවා ය.

“එයා දැන් මොනව ද කරන්නේ ආන්ටි?”
සරෝජා ඇසුවත් ඒ මොහොතේ බස් නැවතුමට විත් නතර කළ බසයක් නිසාවෙන් කාන්තාව කලබලයට පත් වූවා ය.

“දුව, මම යන්න ඕන. මේ බස් එකේ ගියේ නැත්නම් ආයේ ඊළඟ එක එන්න පැය භාගයක් විතර යනවා.”

“ආ ආන්ටි කමක් නෑ, අපි පස්සේ කතා කරමු.”

සරෝජා කීවෙන් කාන්තාව සරෝජාගේ උරහිසත් සෙමෙන් පිරිමැද ඇයට සමුදුන්නා ය.

“ඔයත් පරිස්සමින් ගෙදර යන්න. ගිහින් ඔය ඇඳුම මාරු කරගන්න. මම යන්නම්.”

ඇය බස් රථයත් සමග ආ දුවිලි වලකාලන්නට මෙන් සාරි පොටකින් නාසයත් වසාගෙන බසයට දුවන්නට විය.

මල්ලි

සරෝජා යළිත් නිවසට ගියා ය. ඒ යද්දීත් ඇයගේ නිවසේ දොර විවෘතව වී තිබිණි.

"මල්ලි තමුසෙ ගෙදර ද?"

ඇය කෑ ගසමින් නිවසට ඇතුළු වූවා ය. නිවසින් එළියට පැමිණියේ අත්දිග සුදු කමිසයක් සහ ටයි එකක් දමාගත්, උස තරුණ කොල්ලෙකි. සරෝජාව දුටු විගස ම ඔහුගේ දෑස ඇයගේ ඩෙනිම් කලිසම වටා ඇති රතු පැහැ සළුව දෙසට හැරුණේ ය.

"ඔය මොකද ඕයි කාලි අම්මා වගේ ඩෙනිමට උඩින් රතු පාට රෙද්දකුත් ඇඳගෙන?"

ඔහු ඇසුවෙන්, සරෝජා ඔහු දෙස බලා විරිත්තන්නට වූවා ය.

"ආ කාලී අම්මා ඩෙනිම් අඳිනවනේ, අනේ යනවා ඕයි යන්න..."

ඇය ඔහුවත් තල්ලු කරගෙන ගෙට ඇතුළු වූවා ය.
"මේ ඒක නෙමෙයි, තමුසේ ඔය බොරැල්ල හන්දිය පැත්තට නේද යන්නේ?" ඒ ඇතුළ්වෙද්දී යළිත් හැරී ඈ ඇසුවා ය.

"ඔව් ඇයි?"

"ඔහොම ඉන්නවා, මමත් එන්නම් මාවත් දාගෙන යනවා."

"කොහෙට ද?"

"බොරැල්ල බස් හෝල්ට් එකට."

"ඉතින් දැන් තමුසෙ බස් හෝල්ට් එකේ ඉඳන් නෙමෙයිද ආවේ?"

"බස් හෝල්ට් එකේ ඉඳන් තමයි ගොනෝ ආවේ, ඒත් ආයේ යන්න ඕන."

"මට බෑ මට පරක්කු වෙනවා."

"අනේ පොඩ්ඩක් ඉන්නවකෝ, මොකක් ද හලෝ..."

"මට පරක්කු වෙනවා."

"විනාඩියයි. ඉන්නවා විනාඩියක්, මම මේ ඇඳුම වෙනස් කරගෙන එනකන්. නැත්නම් මට ආයෙත් පයින් යන්න වෙනවා, ප්ලීස් මල්ලි..."

ඇය ඔහුට 'මල්ලි' යැයි කියද්දි ඔහුගේ දෙනෙත් වෙනස් වී ගියේ ය. නිවසේ උළුහස්සට හේත්තු වී හිටගත් ඔහු සරෝජා දෙසට හැරුණේ ය.

"හරි ඉක්මනට එනවා, මේ ඒක නෙමෙයි තමුසෙ මොකද ඉතින් බස් හෝල්ට් එකේ ඉඳන් ආයේ ගෙදර ආවේ?"

ඔහු ඒ සමග ම සරෝජා ඉන වටේ බැඳගෙන ඇති සළුව දෙස බැලුවෙන් සරෝජා ඇඹරෙන්නට විය. ඔහුට කාරණය වැටහෙන්නට ඇත.

"කමක් නෑ, තමුසෙ ඉක්මනට එනවකෝ හැබැයි විනාඩි දෙකයි, ආවේ නැත්නම් මම ගියා."

"හරි හරි පොඩ්ඩක් ඉන්නවකෝ මම ඉක්මනට එනවා."

සරෝජා එයින් සෑහීමකට පත් වී ඇයගේ කාමරයට වැදී අතුරුදහන් වූවා ය.

*****

කාරය පණ ගන්වාගත් සේපාල සරෝජා එනතුරු නිවස දෙස බලා සිටියේ ය. ඉක්මනින් ම යා යුතුව ඇත. එය සඳුදා දිනයක් වූ නිසාවෙන් උදෑසන රැස්වීම ආරම්භ කිරීමට ඇත්තේ තවත් විනාඩි පහළොවකට ආසන්න කාලයක් පමණි. සේපාල

රාජකාරි කළ ඉන්ෂුවරන්ස් ආයතනය බොරැල්ල හන්දියේම පිහිටා තිබුණු නිසාවෙන් ඔහුට ඒ දුර යාමට එතරම් වේලාවක් ගත නොවනු ඇත. ඔහු හරි වේලාවට ම නිවසින් එළියට ආවේ රැස්වීමට ප්‍රමාදයක් නොවනු පිණිස ය. ඒත් දැන් ඔහුට ගමන නවත්වා සරෝජා එනතුරු බලා සිටීමට සිදුවී ඇත.

"මේ හෝන්තුව තවම නෑ."

ඔහු නිවස දෙස බලාගෙන මුමුණන්නට වූවේ ය. ඔහුගේ මුහුණේ ඇත්තේ නොඉවසිල්ලකි. කාරයේ හෝන් එකට අත යැවූ ඔහු දෙවරක් හෝන් එක නාද කළේ ය. ඒත් සරෝජා එළියට නොපැමිණි තැන කාරය පණගන්වා ගත් ඔහු එය මාවත දෙසට හරවා ගත්තේ ය.

"අක්කේ ඉක්මනට එනවකෝ... යන්න ඕන."

ඔහු ඒ ගමන් ම ජනේලයෙන් ඔළුව ඔබා කෑ ගැසුවේ ය. නිවස තුළ දී කොතරම් අක්කා සමග වාදෙට ගියත්, වටපිට මිනිසුන් සිටින තැන්වල දී ඔහු නිරන්තරයෙන් ම සරෝජාට කතා කළේ ගෞරවයෙනි. ඒ හඬත් සමග ම නිවසින් එළියට ආ සරෝජා දොරත් වසා ඉක්මනින් ම කාරය වෙත දිව ගියා ය. කාරයේ ඉදිරිපස අසුනේ හිඳගත් ඈ උද්‍යෝගයෙන් තම සොහොයුරා දෙස බැලුවා ය.

"හරි යමු..."

ඒත් සේපාලගේ දෑසේ ඇත්තේ ප්‍රශ්නාර්ථයකි. ඔහු ඇයගේ ඇඳුම දෙස බලා, විමතියෙන් මෙන් කට විවර කරගත්තේ ය.

"ඇයි මොනව ද බලන්නේ?"

ඒ බැල්මෙන් සරෝජාගේ දෑස් යළිත් කෝපාවිෂ්ට විය.

"බලන්නේ තමුසෙ මොකක් ද ඇඳගෙන ඉන්නේ කියලා..."

"ඇයි මම මොකක් ඇන්දත් මොකද?"

"මට නම් කමක් නෑ ඒත් සිටි එකේ ගෑවෙන් නැත්නම්."

"අනේ මේ ගෑවෙන්න දෙයක් නෑ. කටවහගෙන යනවද මගෙන් මැරුම් කන්නැතිව..."

සරෝජා ඇගේ අතක් මිට මොළවා ඔහුගේ හිසට පහරක් ගැසී ය. සේපාල සිනහසුණේ ය. අක්කා යක්ෂණියක් බැව් දන්නා ඔහුට ඇයව ඇවිස්සීමත් සතුටට කරුණකි.

"හරි, සීට් එකේ ගෑවිලා තිබ්බොත් බලාගමු."

"බලාගනියි මගේ නැටිට, ඉක්මනට යනවා මට පරක්කු වෙනවා."

"ආ, තමුසෙ කියනකන් හිටියේ ඉක්මනට යන්න."

ඔහු සරෝජාට පේන්න ම කාරයේ ඇක්සලේටරය තදින් පෑගුවෙන් කාරය වේගයෙන් ඉදිරියට යන්නට විය.

"ඔව්වර හයියෙන් යන්නේ මාව මරන්න ද? හිමිහිට යනවා."

"දැන් එහෙනම් කිව්වේ ඉක්මනට යන්න කියලා..."

සේපාල සිනහසුණෙන් සරෝජා ඔහුටත් අපවාද නගමින් තම බෑගය විවර කොට එහි තිබුණු දුරකථනය අතට ගත්තා ය. ඒත් සමග ඇයගේ දෑස් බෑගයේ ඇති රතු සළුවට යොමුවිය. එය දැකීමෙන් ඇයගේ මුහුණ එක්වර ම වෙනස් වන්නට විය.

'කොහොම ද මම මේක ආයෙ ඒ ආන්ටිට දෙන්නේ?' ඇය සිතන්නට වූවා ය.

'මම අඩුම තරමේ එයාගේ නමවත් දන්නේ නෑ. එයා කොහෙ ද? ආයේ හෝල්ට් එකට එනව ද? මට ඒ මොකවත් ම අහන්න බැරිවුණා.' ඇය බෙරිකරගත් මුහුණකින් යුතුව කල්පනා කළා ය.

'මට තිබුණේ එයාගේ මොබයිල් නම්බර් එකවත් ඉල්ල ගන්න. එහෙම ඉල්ලගත්ත නම් ආයේ කතා කරන්න තිබ්බා.'

ඇය ඒ සිතුවිල්ලත් සමග ම දුරකථනය විවෘත කොට එහි තිබුණු වීඩියෝව බැලුවා ය. බස් නැවතුමේ දී සිදු වූ සිදුවීම හොඳින් ම පටිගත වී ඇත. සියල්ල පැහැදිලි ය. කොටින් ම නාකියා ලිහුව පිරිමදිමින්, ලොබ ඇස් දෙක බස් නැවතුමේ තරුණිය දෙසට දික් කරගෙන සිටින කොටස වඩාත් හොඳින් එහි සටහන් වී ඇත. සරෝජා ඒ මොහොතෙ ම ක්‍රියාත්මක වූවා ය. වීඩියෝව තම 'යක්ෂණී' පිටුවට අප්ලෝඩ් කළ ඈ එහි මෙසේ ලිව්වා ය.

"මා මෙන් ම අනිත් යක්ෂ කෙල්ලන් ද අවදි විය යුතු කාලය පැමිණ ඇත. ඔබ වෙනුවෙන් ඔබවත් කතා නොකළොත් වෙනත් කිසිවෙකුත් ඔබ වෙනුවෙන් කතා නොකරනු ඇත. ඒ නිසා මෙවන් මානසික ලෙඩුන් දුටු තැන හඬ නගන්න. කිසිම විටෙක නිහඬව නොසිටින්න. - යක්ෂණී"

ඇය එය මුදාහැරියා ය.

නල්ල ගල

සරෝජාගේ කතාව මේ ආකාරයෙන් සිදුවෙද්දී කොළඹ-මරදාන පාරේ තවත් සිදුවීමක් සිදුවෙමින් ඇත.

පංචිකාවත්ත හරහා මරදාන හන්දියට පැමිණෙමින් තිබුණු කුණු ලොරියකි. කුණු ලොරියේ ප්‍රමාණයට වඩා කුණු පටවා තිබුණෙන්, එහි පසුපස කොටසින් එළියට ඉළිප්පී තිබුණු තිබුණු පෝර බෑග් කිහිපයකි. ඕනෑම මොහොතක පොළොව සිප ගැනීමට මෙන් ඒවා ඉවතට බර වී ඇත. ලොරිය ඉක්මනින් ම කැලණිය කුණු ගබඩාව වෙත රැගෙන ගොස් හිස් කළ යුතු නිසාවෙන් රියැදුරු අසුනේ සිටි කොළුවා ද එය ධාවනය කළේ වේගයෙනි.

කොළඹ පංචිකාවත්ත හරහා පැමිණි ලොරිය මරදාන සංඥා පුවරුව අසල දී නතර කළේ ය. සංඥා පුවරුවේ රතු සලකුණ වැටී ඇත. හතරමං හන්දියේ හරස් පාර හරහා වාහන වේගයෙන් ගමන් කරමින් පවතියි. මෙතැන විනාඩි කිහිපයක් රැඳී සිටිය යුතු නිසා ම ලොරියේ රියැදුරු අසුනේ සිටි කොළුවා රේඩියෝව දැමුවේ ය. එහි ගියේ දමිළ සිංදුවකි. සිංදුවේ තාලයට සුක්කානමට අතින් තට්ටු කළ ඔහු වටපිට බලන්නට විය. ඔහුට

පිටුපසින් වාහන එක පේළියට නවත්වා ඇත. ඔහු අසල ම දකුණු පසට වන්නට ඇත්තේ රතු පැහැති කාරයකි. එහි රියැදුරු අසුනේ සිටින්නේ තරුණ ගැහැනු ළමයෙකි. ඔහු යාන්තමින් ඇස කරකවා කාරයේ ජනේලය පහතට බැල්මක් හෙළුවේ ය.

ඇය ඇඳ සිටින්නේ කොට සායකි. ඒ සායෙන් එළියට පැන ඇති ඇයගේ කලවා ඉර අව්වට සුදෝ සුදු පාටින් බැබළෙමින් ඇත.

‘නල්ල ගල’

කොළුවා එය දකිත් ම දම්ළ සිංදුවේ ආකාරයට ම මිමුණුවේ ය. ඉන්පසුව ඔහුගේ රබර් ඇස කාරයේ ජනේලය අස්සෙන් එබූ ඔහු ඒ දෙස ටික වේලාවක් හොර බැල්මෙන් බලාගෙන සිටියේ ය.

කාන්තාවකගේ එළියට නිරාවරණය වන කකුලක් දැකීමෙන් පමණක් අංගජාතය කෙළින් වන එවුන් ලංකාවේ අපමණ ය. කොල්ලාත් එසේම ය. කෙල්ලගේ කකුල දැකීමෙන් ඌගේත් අංගජාතයට කිචියක් ආවෙන් කොල්ලා එක් අතක් සුක්කානමේ තිබියදී ම අනෙක් අත පහතට ගෙන ගියේ ය.

කාලය ගත වී යනු ඔහුට දැනුණේ නැත. කෙල්ලගේ සුදු කලවා ඔහුගේ මනස සම්පූර්ණයෙන් ම ඇයගේ කකුල් අතර හිරකොට ඇත. ඔහු ඒ දෙස බලාසිටියදී ම එක්වර ම පිටුපස ඇති වාහන හෝන් ගසනු ඇසුණෙන් ක්ෂණිකයෙන් ඔහු තම සිහින ලෝකයෙන් මිදී පියවි ලෝකයට පැමිණියේ ය.

ඔහු අසල නවතා තිබුණු කෙල්ලගේ කාරයත් එසැණින් ම පියඹා යන්නට වූවෙන්, පහත් වී සංඥා පුවරුව දෙස බැලූ ඔහු එතෙක් සිරකරගෙන සිටි තිරිංග නිදහස් කර හැරියේ ය.

- සංඥා පුවරුව කොළ පැහැ වී ඇත. පිටුපස වාහන ද හෝන් ගසමින් ඉස්සර වන්නට තැත් කරයි. ඔහු ඉදිරියේ රතු පැහැ කාරය වේගයෙන් වංගුව කපමින් ප්‍රධාන මාවතට පිවිසෙයි. ඔහු ද නැවතුණේ නැත. ඇක්සලේටරය තදින් පෑගූ ඔහු ලොරියේ වේගය තවත් වැඩි කළේ ය. -

ඒ පෑගූ වේගයට කුණු ලොරිය වංගුවේ තිබුණු යකඩ වැටේ නොවැදී බේරුණේ අනූ නවයෙනි. කොළුවා වේගය කෙසේ හෝ පාලනය කරගෙන එය පාර මැදට හරවා ගත්තේ ය. ඒත් ඒ වේගය නිසා ම කුණු ලොරියේ පිටුපස කොටසේ පොළොවට වැටීමට ආසන්නව තිබුණු කුණු බෑගයක් ලොරියෙන් ඉවතට විසි වී ගියේ ය. එහි තිබුණු කුණු පාර දිගට විසිරෙන්නට වූ අතර, බෑගයෙන් එළියට ආ කළු ගුළියක් වැනි යමක් පාර දිගේ රෝල් වී විත් පිටුපසින් ආ බස් රථයේ රෝදයට යට වී චප්ප වී ගියේ ය.

එය රෝදයට චප්ප වී යද්දී එම කළු ගුළියෙන්, පිටතට විසි වූයේ ඇසකි. එම ඇස වංගුවේ තිබුණු මෝටර් බයිසිකල්කරුවෙකුගේ ඔඩොක්කුවට වැටුණෙන් එයින් බියට පත් මෝටර් බයිසිකලය පැදවූ තැනැත්තා බෙරිහන් දෙමින් එය ඉවතට විසි කිරීමට තැත් කළේ ය. එකවර ම ඔහුව මෝටර් බයිසිකලයත් සමග බිමට ඇද වැටුණේ ය. ඔහුගේ ඔඩොක්කුවට පතිත වූ ඇස ද ඔහු සමග ම බිමට වැටුණත් ඔහු පාදයන් පොළොවේ ගසමින්, දඟලමින්, එය තමන් අසලින් ඈත් කිරීමට යත්න දැරුවේ ය.

නිමේෂයකින් මරදාන හරස් මාර්ගය එකම ගාලගෝට්ටියක් බවට පරිවර්තනය විය. හතරමං හන්දිය හරහා ධාවනය වෙමින් තිබූ වාහන සියල්ල ම එකපිට එක නැවතෙන්නට වූ අතර, මරදාන ප්‍රධාන මාර්ගය හෝන් හඬින් සහ වාහන තදබදයකින් පිරී යන්නට විය.

මේ අතර බසයෙන් බැසගත් කොන්දොස්තර බසයේ රෝදවලට චප්ප වී ගියේ කුමක්දැයි බැලීමට පොළොවට නැඹුරු වී බසයේ ඉදිරිපස රෝදය දෙස බැලුවේ ය. එතැන ලේ විලකි. රෝදයට චප්ප වූ දේ කුමක් හෝ වේවා එයින් විසිරී ගිය මස් වැදලි පාරේ සෑම තැන විසිරී ගොස් ඇත. ඒ මස් වැදලි අතර කළු පැහැ යමක් දුටුවෙන් ඔහු ඒ කුමක්දැයි බැලීමට දෑස තවත් ටිකක් ඒ දෙසට යා කළේ ය.

එතැන වූවේ කෙස් රොදකි. චප්ප වී ගිය ඔළුවේ පැත්තකින් එම දිගු කෙස් රොද ඔහුගේ දෑසට හොඳින් ම පෙනුණෙන්, එය දැකීමෙන් ආ පිළිකුලත්, ඔක්කාරයත් නිසා ඔහු බසයත් අල්ලාගෙන එතැන ම වමනය කරන්නට වූවේ ය.

*****

සරෝජා ඔහුගේ සහෝදරයා සමග ම බොරැල්ල හන්දියට පැමිණ සිටියා ය.

"ඉක්මනට බහිනවා... මට යන්න ඕන."

සේපාල කාරය බස් නැවතුමට ගෙන එන ගමන් පැවසුවෙන් සරෝජා තම බෑගයත් තුරුළු කරගෙන කාරයෙන් බැසීමට සූදානම් වූවා ය. ඒත් මේ මොහොතේ එක්වර ම ඇයගේ දුරකථනය නාදවන්නට වූයෙන් ඇය එය අතට ගෙන බැලුවා ය.

'එඩ්වර්' ලෙස එහි සටහන් වී ඇත. ඇය ඉක්මනින් ම එයට පිළිතුරු දුන්නා ය.

"ඔව් මිස්ටර් අතුල.."

"සරෝජා, ඔයා දැන් කොහෙ ද ඉන්නේ?"

"මම දැන් ඔෆිස් එකට එන ගමන්."

"නෑ ඔයා දැන් කොහෙ ද ඉන්නේ? මට ඉන්න තැන කියන්න."

සරෝජා ඈ ඉදිරියේ ඇති බස් නැවතුම දෙස බැලුවා ය.

"මම බොරැල්ල හන්දියේ රිජ්වේ එක ළඟ."

"හරි, එහෙනම් ඔහොම ම මරදාන පොලිසියට යන්න. මරදාන පොලිසිය ළඟ මේ දැන් ඇක්සිඩන්ට් එකක් වෙලා. ඩෙඩ් බොඩි එකක්... ඔයාගේ යාළුවාව සෙට් කරගන්න, නිව්ස් එක ගන්න පුළුවන්."

ඔහු යහළුවා යැයි කීවේ මරදාන පොලිසියේ සහකාර පොලිස් පරීක්ෂක රවින්ද්‍ර වික්‍රමගේට ය. සරෝජාගේ දෑස් එයින් වෙනස් වී ගියා ය. ඇයගේ නිල නොලත් ආදරවන්තයා වික්‍රම බැව්

පත්තර කන්තෝරුවේ අය පමණක් නොව, වික්‍රම සේවය කරන මරදාන පොලිසියේ ද කිහිපදෙනෙකු දනියි.

“ඩෙඩ් බොඩි එකක්...!” ඇය ඇසුවා ය.

“ඔව්... ආරංචි වුණ විදියට ගැහැනු කෙනෙක්. ඔයා ඔහොම ම එතැනට යන්න, වික්‍රමගේත් සෙට් කරගෙන කොහොම හරි නිව්ස් එක අපිට ගන්න. සරෝජා මේක බ්‍රේකින් නිව්ස් එකක්, ඔයාගෙ චාන්ස් එක.”

ඔහු එසේ පවසා දුරකථනය විසන්ධි කළෙන් ඒ ඇසිල්ලෙන් ම සරෝජා අවිනිශ්චිත බැල්මකුත් සමග සේපාල දෙසට හැරුණා ය. සේපාල කාරය බොරැල්ල බස් නැවතුමට හැරවීමට සූදානමින් සිටියි.

“මල්ලි, මාව ඔහොම ම මරදානට එක්ක යනවකෝ...”

“මරදානට? තමුසෙට පිස්සු ද? මට ඔෆිස් යන්න පරක්කු වෙනවා.”

“අනේ මොකක් ද ඕයි... මට හදිස්සි වැඩක්. එඩිටර් කතා කළේ, මරදානේ හදිස්සි කේස් එකක්. මට එතනට යන්න වෙනවා.”

“එඩිටර් කිව්වේ කවුද අර ජමාත් කාරය ද? රැවුල වවාගෙන ඉන්නේ...”

සේපාල සිනාසෙමින් සරෝජාගේ ආසනය පැත්තට අත දා ඇයගේ දොර විවර කරන්නට විය.

“මට ඒ රැවුලගෙන් වැඩක් නෑ, තමුසෙ ඔතනින් බැහැලා බස් එකේ යනවා.”

“බෑ.. අනේ, බස් එකේ ගියොත් මට වෙලාවට යන්න වෙන්නෑ.”

“එහෙනම් වීල් එකක යනවා.”

සරෝජා බයාදු බැල්මකින් සේපාල දෙස බැලුවා ය.

"අනේ මල්ලි ප්ලීස්... මේකෙම ගියොත් විනාඩි පහකින් යන්න පුළුවන්. ඒ තරම් දුරක් නෑනේ, අනේ මාව එක්ක යනවකෝ."

"පිස්සු ද අක්කේ? මට දැන් රැස්වීමක්."

"අනේ මල්ලි..."
සරෝජා තවත් බැගෑපත් වෙන්නට විය. ඇය ආයාසයකින් දෑසට කඳුළු පුරවාගත්තා ය.

එහෙත් එක්වර ම කුමක් හෝ හේතුවකට ඇය නිහඬ වූවා ය. මොහොතකට බිම බලාගත් ඇය යමක් සිතන්නට පටන් ගත්තා ය. ඒ සිතුවිල්ලෙන් ඇගේ දෑස්වලට තවත් කඳුළු උනන්නට විය. ඇය කඳුළු පිරි දෑසත් සමග සේපාල දෙසට හැරුණා ය.

"අම්මා..." ඇය කෙඳිරුවා ය.

ඇයගේ දෑස්වල ඇත්තේ තීක්ෂණ බැල්මකි. ඒවා එක එල්ලේ ම සේපාල දෙසට හැරී ඇත්තේ තර්ජනාත්මක ස්වරූපයෙනි. ඈ දෙස බැලූ සේපාල ද එම බැල්මෙන් වෙනස් වී ගියේ ය. ඔහු කිසිවක් කීවේ නැත. ඒ වෙනුවට කාරයේ ඇක්සලේටරය තදින් පෑගූ ඔහු කාරය යළිත් පාරට හරවා ගත්තේ ය.

බොරැල්ලත් මරදානත් අතර දුර විනාඩි දහයක් පමණ වන්නට ඇත. ඒත් ඒ දුර පැය ගාණක දුරක් යැයි සේපාලට දැනී තිබුණේ ය. ඔහු කාරය මරදාන පොලිස් ස්ථානය ඉදිරියේ නවත්වා, සරෝජාට කිසිත් නොකියා ම මාර්ගය දෙස ම බලාගෙන සිටියේ ය. සරෝජා සූදානම් වූවා ය. වාහනය තුළදී ම බෑගය විවර කළ ඇය එතුළ වූ රතු සළුව එළියට ගෙන එයින් ඇයගේ දෑස්වල වූ කඳුළු පිසදා ගත්තා ය. ඉන්පසුව කුඩා ක්‍රීම් බෝතලයක් එළියට ගෙන එය ඇයගේ අත්වල සහ මුහුණේ තවරාගෙන කාරයේ උඩු කණ්ණාඩිය හරවා මුහුණ බැලුවා ය.

"හ්ම්, දැන් හරි. මම යනවා..."